ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

INS වේලා සඛමැරීනය කොළඹට පැමිණේ

ඉන්දීය නාවික හමුදාවේ INS වේලා සඛමැරීනය 2024 නොවැම්බර් 10 වන දින තදේන සංචාරයක් සඳහා කොළඹ වරායට ළඟා විය. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සඛමැරීනය නාවික හමුදා සම්ප්‍රදායානුකූලව පිළිගන්නා ලදී.

2. කල්වාරි පන්තියේ ඩීසල් විදුලි සඛමැරීනයක් වන INS වේලා සඛමැරීනය 2021 නොවැම්බර් 25 වන දින ඉන්දීය නාවික හමුදාවට එක් කරන ලදී.

3. සඛමැරීනයේ අණදෙන නිලධාරී කොමාන්ඩර් කපිල් කුමාර් මහතා බටහිර නාවික මූලස්ථානයේ දී බටහිර නාවික ප්‍රදේශය භාර අණදෙන නිලධාරී රියර් ඇඩ්මිරාල් ඩබ්. ඩී. සී. යූ. කුමාරසිංහ මහතා හමු වීමට නියමිතය. ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ සාමාජිකයන් සඳහා ද සඛමැරීනය නැරඹීමට අවස්ථාව හිමි වනු ඇත. සඛමැරීන කාර්ය මණ්ඩලය සහ වැලිසර ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරේ ශ්‍රී ලංකා නාවික හමුදා සාමාජිකයන් අතර පැසිපන්දු තරඟයක් ද සංවිධානය කර ඇත.

4. සඛමැරීනය මමෙ සංචාරය අතරතුරදී අවශ්‍ය සැපයුම් සම්පාදනය කර ගනු ඇත. සඛමැරීනයේ කාර්ය මණ්ඩලයට කොළඹ අවට විවිධ ස්ථාන නැරඹීමේ අවස්ථාව ද හිමි වනු ඇත. සඛමැරීනය 2024 නොවැම්බර් 13 වන දින දිවයිනෙන් පිටත්ව යනු ඇත.

5. ඉන්දීය නාවික හමුදා/වරෙළාරක්ෂක බලකා නෞකා නිරන්තරයෙන් ශ්‍රී ලංකාවට පැමිණේ. මමෙ සංචාරය ඉන්දියාවේ 'අසල්වැසියා ප්‍රථමයෙන්' යන ප්‍රතිපත්තිය සහ අග්‍රාමාත්‍යතුමාගේ 'කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය' යන SAGAR දැක්ම අනුව සමුද්‍රීය රාජ්‍යයන් දකෙ අතර ද්විපාර්ශ්වික සහයෝගීතාවය සහ සහෝදරත්වය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

***

කොළඹ
2024* නොවැම්බර් *10